**නිපුනතාවය -මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.**

**නිපුණත මට්ටම-බැංකු සැසදුම් ප්‍රකාශනය පිළියෙළ කරයි.**

පෙළ පොතේ පිටු අංක 124 සිට 128 පිටු කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1.ව්‍යාපාරයේ බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ අවසාන ශේෂය අසමාන වූ විට එම ශේෂයන් සමාන කිරීමට අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය අපිලිවෙලින් පහත දක්වා ඇති අතර එම පියවර අනුපිළිවෙලින් සකසන්න.

- බැංකු ගිණුමේ හර පැත්ත හා බැංකු ප්‍රකාශනයේ බැර තීරුව සසදා සටහන් නොවී ඇති කරුණු සොයා ගැනීම.
- සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය පදනම් කර ගෙන බැංකු සැසදුම් ප්‍රකාශනය පිළියෙළ කිරීම.
- බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ අවසාන ශේෂය සමාන වන්නේදැයි සොයා බැලීම
- බැංකු ගිණුමේ බැර පැත්ත සහ බැංකු ප්‍රකාශනයේ හැර තිරුව සසදා සටහන් නොවී ඇති කරුණු සොයා ගැනීම
- බැංකු ගිණුමේ සටහන් නොවී ඇති කරුණු ඇතුලත් කර සංශෝධිත බැංකු ගිණුම පිළියෙළ කිරීම

2.බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ අවසාන ශේෂය එකිනෙකට අසමාන වීම සඳහා බලපාන  හේතු 5 ලියන්න.